**සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව - 2023**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**කරුණක් අවධාරණය කිරීම**

බැංකුවේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල යෝජිත වෙනස පිළිබඳව සාකච්ඡා කරන මූල්‍ය ප්‍රකාශන වල සටහන අංක 2.7.ii වෙත මා අවධානය යොමු කරමි. මෙම කාරණය සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලබයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය .

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛන්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2024 ජනවාරි 11 දිනැති ලිපිය මගින් 2024 මාර්තු 31 වන දිනට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් කරන ලෙස බැංකුවට දන්වා ඇතත්,විගණිත දිනය වන 2024 ජූනි 27 දින වන විටත් එය සම්පූර්ණ කර නොතිබුණි. | ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත පියවර ගෙන තිබුණි:<br>-මහ බැංකුවේ උපදෙස් අනුව බැංකුවේ කල්බදු සහ කුලීපිට මිලදී ගැනීමේ කළඹ විකිණීමට පියවර ගෙන ඇත.ගැනුම්කරු සමඟ ගිවිසුම ලබන සතියේ අත්සන් කිරීමට නියමිත අතර විකුණුම් ක්‍රියාවලිය අවසන් අදියරේ පවතී.<br>-කාර්යය මණ්ඩල ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය ස්වාධීන පක්ෂය වන වරලත් මානව සම්පත් කළමනාකරණ ආයතනය(CIPM) විසින් සිදු කර ඇති අතර ඔවුන් සිය වාර්තාව ඉදිරිපත් කර ඇත.<br>-ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙහි (SLSBL) වත්කම් හා වගකීම් පැවරීම 2024 ඔක්තෝම්බර් මාසයේදී ක්‍රියාත්මක කෙරේ.<br>-වත්කම්,බැරකම් සහ කාර්යය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීම 2024.12.31 දිනට පෙර අවසන් කිරීමට නියමිතය. | පවතින සම්පත් නිෂ්කාර්ය නොවන පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | පහත දක්වා ඇති ලැබිය යුතු ශේෂ වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි.<br><br>**විෂයය** — **වටිනාකම (රු.)**<br>ලැබිය යුතු මුද්දර ගාස්තු — 1,999,000<br>පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම — 349,200 | **ලැබිය යුතු මුද්දර ගාස්තු -** වටිනාකම යනු ණය පැහැර හරින ලද පාරිභෝගියකුගේ උකස් කළ දේපළක් බැංකුවට ලබා ගැනීමේදී කරන ලද ගෙවීමකි. මෙම වටිනාකම ආපසු අයකර ගත හැකි වන්නේ දේපළ බැහැර කළ විට පමණි.<br>**පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම -** ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවෙන් පවරා ඇති පහත දැක්වෙන වත්කම් සත්‍යාපනය කිරීමට සාක්ෂි කිසිවක් හමු නොවුණි.<br><br>අයිතමය — වටිනාකම (රු.)<br>අත්තිකාරම් මත ගෙවිය යුතු වට්ටම් — 13,356,809<br>ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) නීති කටයුතු වෙනුවෙන් වූ තැන්පතු අරමුදල — 7,098,200 | 1.ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුව (PSDB) පවරා ගන්නා විට අත්තිකාරම් මත ගෙවිය යුතු වට්ටම් ශේෂය මාරු කර ඇත. එබැවින්, සත්‍යාපනය සඳහා සාක්ෂි නොපැවතුණි.<br>2. ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ ( PSDB) සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනා නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර එහි සම්පූර්ණ වටිනාකම රු.7,098,200 කි. එම නඩු වන්නේ,<br>• SC/HC/LA/01/2017<br>• SC/HC/LA/02/2017 | මූල්‍ය ප්‍රකාශන වල ඇති සෑම ශේෂයන් සඳහාම සාක්ෂි සහ සවිස්තරාත්මක සටහන් පවත්වා ගත යුතුය |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ‘‘ගෙවිය යුතු වෙනත් ණය හිමියන් ’’ යටතේ හෙළිදරව් කරන ලද ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගැනීම් වලින් රු.31,707,499 ක වටිනාකමක් වසර තුනකට වඩා වැඩි කාලයක් පැවතුණි. | **ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB)-ණයහිමියන් -** මේවා ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) පාරිභෝගිකයින් විසින් නොපියවූ ශේෂයන් වේ.එබැවින්,මෙම ශේෂයන් ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගිණුමේ ඇත.<br>සෑම මාස හයකට වරක්, අපි විසින් ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) වගකීම් වල ශේෂයන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරන්නෙමු. | හිඟ ශේෂ සාධාරණ කාලසීමාවක් තුළ සැසඳීම සිදු කර නිෂ්කාශනය කළ යුතුය. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන වල වෙනත් වගකීම් ශේෂයට හඳුනා නොගත් බැංකු තැන්පතු වලින් සමන්විත රු.5,360,365 ක ශේෂයක් හඳුනා නොගත් අවිනිශ්චිත ගිණුමේ ඇතුළත් වී තිබුණි. | බැංකු සැසඳුමේ හඳුනා නොගත් ශේෂයන් බොහොමයක් නිෂ්කාශනය වී ඇත.මෙම තැන්පතු ගණුදෙනුකරුවන් හඳුනා ගැනීම සඳහා කිසිඳු ප්‍රකාශයක් නොමැතිව ගණුදෙනුකරුවන් විසින් ඍජුවම සිදු කර ඇත. එබැවින් ඒවා අවිනිශ්චිත ගිණුමට මාරු කර ඇත. බැංකුව ඔවුන් හඳුනා ගැනීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර ඔවුන් හඳුනා ගැනීම සඳහා වරින් වර පසු විපරම් කර ඇත. තවද, 2023 වර්ෂයේ සහ 2024 අගෝස්තු මාසය දක්වා මේ සඳහා කිසිඳු මුදලක් එකතු වී නොතිබුණි. | සාධාරණ කාලසීමාවක් තුළ හඳුනා නොගත් අවිනිශ්චිත ගිණුමේ ශේෂයන් බැංකුව විසින් සැසඳීම සිදු කර නිෂ්කාශනය කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශවලට අනුව, පහත සඳහන් ශේෂයන් මාස හයකට වැඩි කාලයක් නිෂ්කාශනය නොවී ඉතිරිව පැවතුණි. | ගිණුම්ගත නොකළ බැංකු බැර 2024 ජනවාරි මාසයේදී ගිණුම් ගත කර ඇත. එය 2024 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. | මෙවැනි දෝෂ වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

| අයිතමය | වටිනාකම (රු.) |
|---|---|
| ගිණුම්ගත නොකළ බැංකු බැර | 158,500 |
| ගිණුම්ගත කිරීමේ වැරදි | 13,400 |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු .758,720,218 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු.460,588,117 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.298,132,101 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මූල්‍ය උපකරණවල පොළී ආදායම ඉහළ යාම සහ තැන්පතු අඩු වීම නිසා පොළී වියදම අඩු වීම හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පෙර වසර සඳහා වූ ආංශික අනුපාතයන් සමඟ සැසඳීම පහත දැක්වේ.

| විස්තරය | ආංශික අනුපාත | | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSBL) | |
|---|---|---|---|---|
| | **2023** | **2022** | **2023** | **2022** |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (ROE) (%) | 8.4 | 2.32 | 9.91 | 6.40 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) (%) | 0.5 | 0.13 | 8.45 | 5.19 |
| ශුද්ධ පොළී ආන්තිකය(%) | 2.70 | 2.80 | 18.88 | 14.98 |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 51.5 | 38.27 | 1289 | 954 |
| අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය-ස්ථර 1 (අවම අවශ්‍යතාව 5%) | 15.00 | 14.20 | 163 | 165 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි ඒකාබද්ධයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවය වුවද, බැංකුව වගකීම් විරහිතව ක්‍රියා කළ අවස්ථා කිහිපයක් තිබුණි. සමහර අවස්ථා පහත දැක්වේ.<br><br>i. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂක විසින් දක්ෂ කාර්ය මණ්ඩලයක ඇ ඌනතාවය හේතුවෙන් බැංකුවෙහි ඇ මෙහෙයුම් දුෂ්කරතාවයන් නිසා බැංකුව විසින ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නැවත අවධාරණය කරන ලදී.<br><br>ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරියගේ 2022 මැයි 27 දිනැති ඇයගෙ ලිපියේ දක්වා ඇති පරිදි ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සහ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකු (SLSBL) යන දෙකටම ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සඳහා වූ මුදල් මණ්ඩලය විසින් අනුම කර ඇති විසදුම් රාමුව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී තිබුණි. කෙසෙ වෙතත් ,විසඳුම් රාමුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට දැනුම් දෙන නිවැර කිරීමේ ක්‍රියාමාර්ග නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට බැංකු දෙකම අපොහොසත් වී තිබුණි.<br><br>iii. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරිය 2022 ජනවාරි 13 දිනැති ඇයගෙ ලිපියේ දක්වා ඇති පරිදි යථාර්ථවාදී නොවන පුරෝකථන සහ ප්‍රධාන අවදානම් තක්සේර සාධක නොසලකා බැංකුව විසින් 2022-2026 කාලසීමාව සඳහා උපාය මාර්ගික ව්‍යාපා සැලැස්ම ඉදිරිපත් කර තිබුණි. | ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත පියවර ගෙන ඇත.<br>- මහ බැංකුවේ උපදෙස් අනුව බැංකුවේ කල්බදු සහ කුලීපිට මිලදී ගැනීමේ කළඹ විකිණීමට පියවර ගෙන ඇත. ගැනුම්කරු සමඟ ගිවිසුම ලබන සතියේ අත්සන් කිරීමට නියමිත අතර විකුණුම් ක්‍රියාවලිය අවසන් අදියරේ පවතී.<br>-කාර්යය මණ්ඩල ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය ස්වාධීන පක්ෂය වන වරලත් මානව සම්පත් කළමනාකරණ ආයතනය (CIPM) විසින් සිදු කර ඇති අතර ඔවුන් සිය වාර්තාව ඉදිරිපත් කර ඇත.<br>-ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙහි (SLSBL) වත්කම් හා වගකීම් පැවරීම 2024 ඔක්තෝම්බර් මාසයේදී ක්‍රියාත්මක කෙරේ.<br>-වත්කම්, බැරකම් සහ කාර්යය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීම 2024.12.31 දිනට පෙර අවසන් කිරීමට නියමිතය. | මව් සමාගම සමඟ සාකච්ඡා කර බැංකුව ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මෙහෙයුම් අත්හිටුවීමෙන් පසු (2021 ජනවාරි 05 දින අත්හිටුවන ලදී) බැංකුවේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය බොහෝ ණය වර්ග සඳහා සතුටුදායක මට්ටමක පැවතියද, SLS දිරිය ණය | SLS දිරිය ණය යෝජනා ක්‍රමය සමන්විත වන්නේ කොවිඩ් 19 වසංගතයෙන් සහ රටේ මෑතකාලීන ආර්ථික අර්බුදයෙන් වැඩිම බලපෑමක් එල්ල වූ අංශය වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ලබා දී ඇති ණය වලිනි. | බැංකුවේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් සහ වේගවත් කළ |

යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයක් 2024 මැයි 31 දිනට නිරීක්ෂණය වුණි. එය 2021 ජනවාරි 01 සිට 2024 මැයි 31 දින දක්වා රු.25,666,399 සිට රු.117,316,210 ක් දක්වා වර්ධනය වී තිබුණි.

බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ණයගැතියන් යුතුය. සම්බන්ධයෙන් ගත් කල, 2022 වර්ෂයේ කාලසීමාව තුළ සැලකිය යුතු විශාල වටිනාකමකින් යුත් ණය කිහිපයක් අක්‍රීය ණය වෙත මාරු කර ඇත. කෙසේ වෙතත්,බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද කාලෝචිත අයකරගැනීමේ ක්‍රියාමාර්ගවල ප්‍රථිපලයක් ලෙස, එම කාලය තුල වටිනාකම අඩු වී ඇති අතර සමහර විශාල පහසුකම් නීතිමය ක්‍රියාමාර්ග යටතේ පවතී.

ඒ අනුව 2024.05.31 දිනට රුපියල් මිලියන 117.31 පැවති අක්‍රීය ණය ශේෂය රුපියල් මිලියන 115.8 ක් දක්වා 2024.07.31 දිනට අඩු වී ඇත.තවද මෙම වටිනාකමේ ප්‍රධාන ණය පහසුකම් 3 ක් ඇතුළත් වී තිබුණි.රාජ්‍ය ව්‍යවසායන් (SOE) වෙත ලබා දුන් ණය වලින් 50 % ක් රාජ්‍ය භාණ්ඩාගාර ඇපකරයෙන් සුරක්ෂිත කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මඟපෙන්වීම් වලට අනුකූලව අනෙකුත් 50% ට අයත් ණය රුපියල් මිලියන 27.37 ක් දැනට ක්‍රියාත්මක වන අතර තවමත් අක්‍රීය ණය ලෙස තබා ගෙන ඇත.මෙය 2024 වසර අවසන් වීමට පෙර ක්‍රියාකාරී ණය කාණ්ඩයට මාරු කරනු ඇත.

අනෙකුත් ණය,රුපියල් මිලියන 25 අධිකරණ නඩුවක් යටතේ පවතින දේපළ උකසක් ඇපයට තැබූ එකක් වන අතර,පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියට ගෙන යයි.

එබැවින් බැංකුව විසින් ගනු ලබන දැඩි අයකිරීමේ ක්‍රියාමාර්ග වල ප්‍රතිඵලයක් ලෙස වසර අවසන් වන විට අක්‍රීය ණය ශේෂය අවම වශයෙන් රුපියල් මිලියන 27 කින් රුපියල් මිලියන 88 ක් දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

2021 – 31.07.2024 කාලසීමාව සඳහා පහත දැක්වෙන අක්‍රීය ණය ශේෂ වල මුළු වටිනාකම SLS දිරිය ණය යෝජනා ක්‍රමය සඳහා වන අක්‍රීය ණය හි සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි.

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 31.12.2020 | 25.66 |
| 31.12.2021 | 11.76 |
| 31.12.2022 | 249.0 |
| 31.12.2023 | 206.5 |
| 31.05.2024 | 117.3 |
| 31.07.2024 | 115.8 |

එයින් පසුගිය වසර දෙක තුළ අක්‍රීය ණය ශේෂය ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කරයි.

| | | | |
|---|---|---|---|
| ii. | 2024 මැයි 31 දිනට SLS දිරිය ණය 34 ක සමස්ථ හිඟ ශේෂය රු.187,906,998 ක් වුණි.එයින් ණය ශේෂ 16 ක රු.117,316,210 ක් අක්‍රීය ණය කාණ්ඩයේ වුණි.අක්‍රීය ණය අනුපාතය සියයට 62 ලෙස ගණනය කර තිබුණි. | යොමුව කළමනාකාරීත්ව අදහස් දැක්වීම 3.2 (i) හා සම්බන්ධ වේ. | බැංකුවේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් සහ වේගවත් කළ යුතුය. |
| iii. | ක්ෂුද්‍ර මූල්‍ය ණය වල සමස්ත හිඟ ශේෂය 2024 මැයි 31 දිනට රු.239,967,255 ක් වුණි.එයින් රු.238,960,447 ක් අක්‍රීය ණය ලෙස වාර්ථා කර ගත ඇති අතර අක්‍රීය ණය අනුපාතය සියයට 99.5 ක් ලෙස ගණනය කර තිබුණි. | සමහර ණය ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) සමඟ ඒකාබද්ධ වීමට පෙර ජාතික සංවර්ධන භාර අරමුදල (NDTF) විසින් මූලිකව ලබා දී තිබුණි.මෙම ණය මූලික වශයෙන් අඩු ආදායම්ලාභීන් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ඇත.<br>2021 ජනවාරි 5 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයකට අනුව ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) හට එහි ක්‍රියාකාරීත්වය අත්හිටුවන ලෙස උපදෙස් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව විසින් හිඟ ණය ආපසු අයකර ගැනීමේ අභියෝග ඇති කළ හවුල්කාර සංවිධාන වලට ණය ලබා දීම නවතා දමන ලදී.<br>අත්හිටුවන විට ක්ෂුද්‍ර මූල්‍ය ණය වල හිඟ ශේෂය රුපියල් මිලියන 806.6 ක් වූ අතර ඉන් රුපියල් මිලියන 505.3 ක් ක්‍රියාකාරී ණය සහ රුපියල් මිලියන 301.2 ක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති අතර, එය 37.3% ක අක්‍රීය ණය අනුපාතයක් පිළිබිඹු කරයි.<br>2024 ජුලි 31 වන විට, අපි ක්‍රියාකාරී ණය වලින් රුපියල් මිලියන 504.8 ක් සාර්ථකව අයකර ගත්තෙමු.මෙමගින් ක්‍රියාකාරී ණය සඳහා රුපියල් මිලියන 0.48 ක හිඟ ශේෂයක් ඉතිරි විය.එහි ප්‍රතිඵලයක් ලෙස ඉතිරි හිඟ ශේෂය ප්‍රධාන වශයෙන් අක්‍රීය ණය වලින් සමන්විත වන බැවින් අක්‍රීය ණය අනුපාතය සැලකිය යුතු ලෙස වැඩි විය.<br>මෙම අක්‍රීය ණය හා සම්බන්ධ බොහෝ හවුල්කාර ආයතන (POs) වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර,අයකර ගැනීමේ ප්‍රයත්නයන් සිදුවෙමින් පවතින බව සැලකිල්ලට ගැනීම වැදගත්. | බැංකුවේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් සහ වේගවත් කළ යුතුය. |
| iv. | 2023 දෙසැම්බර් 31 දිනට, බැංකුව 2023 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල වටිනාකම රු.107,817,357 හෝ මුළු වත්කම් වලින් සියයට 73 ක වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි.ඒවා තවමත් භාවිතයේ පවතී. බැංකුව විසින් පරිභෝජනය කිරීමට නියමිත එම වත්කම් වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මත පදනම්ව | බැංකුවේ දේපළ පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බැවින් ඒවා ප්‍රත්‍යාගණනය කර නොමැත. බැංකුව විසින් පිළිවෙලින් 2008 සහ 2010 වර්ෂයන්හි ප්‍රමුඛ හා ඉතිරිකිරීමේ බැංකුවේ සහ ජාතික සංවර්ධන භාර අරමුදල ඒකාබද්ධ කිරීමේදී මාරු කරන ලද දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය පිරිවැය සැළකිය යුතු ලෙස ඉහළ බැවින් සිදු කර නොතිබුණි.එබැවින්,අධික පිරිවැයක් ඇතුළත් වීම සැළකිල්ලට ගනිමින් බැංකුව විසින් දේපළ පිරියත හා | බැංකුව තම වත්කම්වල ඵලදායී ජීව කාලය තක්සේරු කළ යුත්තේ එම වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ මත පදනම්වය. |

| | | |
|---|---|---|
| ඵලදායී ජීව කාලය නිවැරදිව තක්සේරු කර නොතිබුණි. | උපකරණ සටහන යටතේ මූල්‍ය ප්‍රකාශන වල සම්පූර්ණ ක්ෂය වූ වත්කම් හෙළිදරව් කර තිබුණි. සැළකිය යුතු අගයන් සහිත අයිතම පමණක් ප්‍රත්‍යාගණනය කිරීමට කළමනාකාරීත්වය විසින් තීරණය කරන ලදී.එබැවින් වාහන ප්‍රත්‍යාගණනය කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත. | |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | ලේකම් ශ්‍රේණිය I සඳහා වෘත්තීය ගමන් මාර්ගයක් නොමැතිකම යන්න සලකා බලා, 2020 සැප්තැම්බර් 01 දින ලසුලේඛක-III තනතුරු සඳහා සේවකයින් දෙදෙනෙකු උසස් කරනු ලැබූවද, අනුමත සේ වක සංඛ්‍යාව තුළ එම තනතුර නොතිබුණි. | 2019 දෙසැම්බර් 18 වන දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) සාමාන්‍යාධිකාරී /ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් පැවති විධායක මානව සම්පත් කමිටු රැස්වීමේදී ලසුලේඛක- III තනතුර නිර්මාණය කිරීම සම්බන්ධයෙන් තීරණය ගන්නා ලදී. ලේකම් ශ්‍රේණිය I සඳහා වෘත්තීය ගමන් මාර්ගයක් නොමැතිකම යන්න සලකා ඔවුන්ගේ මීළඟ ශ්‍රේණිගත කිරීම/ උසස්වීමේ චක්‍රය ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) ව්‍යුහයට අනුකූල වන පරිදි, ලසුලේඛක- III ශ්‍රේණියේ ස්ථානගත කිරීමට කමිටුව තීරණය කර තිබුණි. | බැංකුව අනුමත සේවක සංඛ්‍යාව සහ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුගත විය යුතුය. |
| ii. | 2023 මාර්තු 31 දිනට බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 95 ක් වන අතර ඔවුන්ට 2021 ජනවාරි 05 සිට 2023 දෙසැම්බර් 31 දක්වා සේවක වැටුප් සහ ප්‍රසාද දීමනා ලෙස රු.744,661,326 ක් ගෙවා තිබුණි. කාර්ය මණ්ඩල වැටුප් ලෙස සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදු වුවද, බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් බැංකුවට තම ගනුදෙනුකරුවන්ට ප්‍රශස්ත ප්‍රතිලාභ ලබා දීමට නොහැකි විය.<br><br>බැංකුවේ ඒකාබද්ධ කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තත්ත්වය ඉදිරි කාලය සඳහා ද පවතිනු ඇති බව පෙනේ. | 2021 ජනවාරි 05 වන දින සිට බැංකුවේ තැන්පතු ලබා ගැනීම සහ ණය දීමේ කටයුතු සීමා කර ඇතත්, අයකර ගැනීම්, නීති ක්‍රියාමාර්ග, මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය, භාණ්ඩාගාර කළමනාකරණය සහ ශාඛා මෙහෙයුම් මෙහෙයුම් වැනි තීරණාත්මක කාර්යයන්හි බැංකුව අඛණ්ඩව නිරත වේ.<br><br>ඊට අමතරව, බැංකුව විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) වෙත 2022 දී ද්විතීයික පදනම මත කාර්ය මණ්ඩල සාමාජිකයන් හතර දෙනෙකු යවා ඇත. තවදුරටත්,කාර්යමණ්ඩල ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) විසින් වරලත් මානව සම්පත් කළමනාකරණ ආයතනය (CIPM) පත් කර ඇත.ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ (SLSBL) කාර්යමණ්ඩලය ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) වෙත අන්තර්ග්‍රහණය කර ගැනීමට සහ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට එය පහසුකම් සපයයි. | බැංකුවේ කාර්යය මණ්ඩලය ඵලදායී හා කාර්යක්ෂම ලෙස යොදා ගත යුතුය. |

| | | |
|---|---|---|
| | සේවක වැටුප් සම්බන්ධයෙන්, අනුමත වැටුප් ප්‍රතිපත්තිවලට අනුව සහ බැංකුවේ බැඳීම් වලට අනුකූලව සේවක වැටුප් ගෙවීම් සිදු කර ඇත. | |

## 3.4 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුව සතුව ධාවනය නොවන තත්ත්වයේ වාහන තුනක් පැවතුණි. වාහන දෙකක (වාහන අංක.65-2021 සහ 59-1697) හිමිකම බැංකුව වෙත පවරා ගෙන නොතිබුණි. එක් වාහනයක් සඳහා ලියාපදිංචි කිරීමේ මුල් සහතිකය නොතිබුණි. | • වාහන අංක 65- 2021 ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුව (PSDB) විසින් 2002 ට පෙර භාරගෙන ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් 2007 දී ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) වෙත පවරා ඇත.මෙම වාහනය බදු සහනය යටතේ අලුතින් ආනයනය කර ඇති අතර ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විසින් ආදායම් බලපත්‍රය ලබා ගැනීමට උත්සහ කලද මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (RMV) විසින් වාහනය ධාවනය කිරීමට බලපත්‍රය නිකුත් කර නොමැති අතර නියමිත බදු ගෙවන ලෙස බැංකුවට උපදෙස් ලබා දී තිබුණි.කෙසේ වෙතත්, බැංකුව මහත් පරිශ්‍රමයක් දරා ආදායම් බලපත්‍රය ලබා ගැනීමෙන් පසු 2019 දක්වා මෙම වාහනය භාවිතා කර ඇත.ගෙවිය යුතු බදු මුදල පිළිබඳව දැනුවත් නොකළද,නියමිත බදු මුදල වාහනයේ වත්මන් වෙළඳපල වටිනාකමට වඩා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.තවදුරටත් වාහනයේ ධාවන තත්ත්වය ලබා ගැනීම සඳහා විශාල තාක්ෂණික අලුත්වැඩියාවක් සිදු කිරීමට ඇත.<br><br>• ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුව (PSDB) සතු වාහන අංක.59-1697 දරන වාහනයේ සත්‍ය හිමිකරු වන්නේ ප්‍රමුඛ කළමනාකරන මූල්‍ය සේවා සමාගමයි.(Pramuka Management Financial Service Ltd.) ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) ඔවුන්ගේ නමට මෙම වාහනය මාරු කිරීමට උත්සහ කළද එය කළ නොහැකි විය. කෙසේ වෙතත්, බැංකුව මහත් පරිශ්‍රමයක් දරා ආදායම් බලපත්‍රය ලබා ගැනීමෙන් පසු 2019 දක්වා මෙම වාහනය භාවිතා කර ඇති අතර ඉන්පසුව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (RMV) විසින් වාහනය ධාවනය කිරීමට බලපත්‍රය නිකුත් කර නොමැත. | බැංකුව තම වත්කම් වල හිමිකම බැංකුව සතු බවට සහතික විය යුතුය. |

- වාහන අංක. AAE-9755 (ත්‍රී වීලරය) ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) විසින් මිලදී ගෙන ඇත්තේ දොරින් දොර ව්‍යාපාර කටයුතු සඳහා පමණක් මිලදී ගෙන ඇත.ව්‍යාපාර කටයුතු අත්හිටුවීම හේතුවෙන් වෙනත් වාහන කිහිපයක් තිබූ බැවින් මෙම වාහනය භාවිතය සඳහා කිසිඳු ඉල්ලීමක් ලැබී නොමැත.